**තණමල්විල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් කැබලි 92 ක හා සියලුම ගොඩනැගිලිවල වටිනාකම පිළිගත් වෘත්තිය තක්සේරුකරුවකු ලවා තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ට්‍රැක්ටර් ට්‍රේලරයක වටිනාකම රු. 235,000 ක් වුවත් එය රු. 2,350,000 ක් ලෙස රු. 2,115,000 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ තණමල්විල කොම්පෝස්ට් අංගනයේ ඉදිකරන ලද ගොඩනැගිල්ලක් සඳහා රු. 262,345 ක් වැය කර තිබුණද, එම වියදම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.2** **අසම්භව්‍ය බැරකම්**
**--------------------**

ප්‍රාදේශීය සභාවට එරෙහිව 2005 සහ 2006 වර්ෂවල ගිවිසුම්ගත වූ කර්මාන්ත 5ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කාර සමිති විසින් වැල්ලවාය දිසා අධිකරණයේ පවරා ඇති නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 2,080,474 ක් වු අතර උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 1,562,346 ක් විය.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ඉකුත් වර්ෂ සඳහා වූ ගෙවිය යුතු රු. 247,490 ක හිඟ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 21 දිනට, දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 2,688,584 ක හිඟ ණය වාරිකද රු. 840,336 ක හිඟ පොළියද සමාලෝචිත වර්ෂයේදීද ගෙවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 77,955,142 ක වත්කම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i) 19 (1) (1) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව අනියම් හා ආදේශක පදනම මත පුස්තකාල සහායක, මුරකරු, සෞඛ්‍ය කම්කරු, මාර්ග කම්කරු, ඖෂධ සංයෝජක, ආයුර්වේද කම්කරු සහ රියදුරු යන තනතුරු සඳහා සේවකයින් 16 දෙනෙකු බඳවා ගෙන 2014 ජුලි සිට 2015 දෙසැම්බර් දක්වා වැටුප්, සේවක අර්ථ සාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායක ලෙස රු. 2,419,896 ක් ගෙවා තිබුණි. |

(ii) 49 වගන්තිය

සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව සහා බල ප්‍රදේශයේ දුරකථන සමාගම් 3ක් විසින් කුළුණු 07ක් ස්ථාපිත කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**
---------------------------------------

මු.රෙ. 71

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව අනියම් හා ආදේශක පදනම මත සේවය කළ පෙර පාසල් පාලිකා, පුස්තකාල සහායක, මාර්ග කම්කරු, සෞඛ්‍ය කම්කරු සහ ක්ෂේත්‍ර කම්කරු යන තනතුරු සඳහා සේවකයින් 19ක් අනුමත කාර්ය මණ්ඩලයට පිටින් ස්ථිර සේවයට පත් කරගෙන තිබුණි.

(ඇ) 2003 අංක 17 දරන පනතින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනත

විශ්‍රාම වැටුප් රහිත තාවකාලික, මාසිකව වැටුප් ලබන සේවකයින්ගෙන් සියයට 8ක් හා සභාවේ දායකත්වය සියයට 12 ක් වන පරිදි රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් යැවිය යුතු වුවත්, සභාව විසින් 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අනියම් සේවකයින් 16 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායක වශයෙන් රු.319,543 ක් ප්‍රේෂණය කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,742,191 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,663,013 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 4,079,178 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 කඩ කුලී**
---------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු කඩ කාමර වලින් අයවිය යුතු හිඟ කුලිය රු. 1,181,600 ක් විය.

(ආ) ඩංඩුම මොරකැටිය හංදියේ පිහිටි කඩ 19 කින් වාර්ෂිකව රු. 6,000 බැගින් කඩකුලී රු.778,750 ක මුදලක් අයවීමට තිබුණි.

(ඇ) තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2015 වර්ෂයට පෙර සතිපොළවල්, මස්කඩ හා මාළු ලැල්ල බදුගත් පුද්ගලයින්ගෙන් රු. 820,575 ක හිඟ ආදායමක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.4,370,093 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.170,700 ක මුදලක් අයකර ගැනිමට තිබුණි.

**2.3 අධිභාර**

**---------**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.672,220 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------**

(අ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2 (1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන, වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 91,670 ක වියදමක් දරා තිබුණි.

(ආ) රු. 579,698 ක් වටිනා පුස්තකාල පොත් 3046 ක් හා රු. 225,000 ක් වටිනා උපකරණ වසරකට වැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින පුස්තකාල 15 ක ගබඩා කර තිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

**-------------------**

බුත්තල ප්‍රාදේශීය සභාව මඟින් 2014 නොවැම්බර් 29 දින ජී.අයි. බට 384 ක් තණමල්විල ප්‍රාදේශීය සභාවට ලබාදී තිබු අතර 2016 මැයි 17 දින කරන ලද භෞතික පරික්ෂාවේදී ජී.අයි.බට 313 ක් ඉදිරිපත් නොකෙරුණි. මේ සඳහා නිකුත් කිරිමේ නියෝග ලබාගෙන නොතිබු අතර ලැබීම් නියෝග මඟින් ඉන්වෙන්ට්‍රිගත කිරීමක්ද සිදුකර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වටිනාකම රු. 2,140,000 ක වාහන 4ක් සහ වටිනාකම රු. 275,000 ක් වටිනා ට්‍රේලර් 2 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාව සතු 14 කණුවේ ඉදිකර තිබු සතිපොළ ගොඩනැගිලි දීර්ඝ කාලයක සිට බදු දීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද වටිනාකම රු. 2,655,318 ක් වූ අංක RD - 9741 දරන ට්‍රැක්ටර් රථය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

**බෝදාගම සමාධිගම ජල ව්‍යාපෘතිය**

**---------------------------------------**

බෝදාගම ජල ව්‍යාපෘතිය සඳහා හුදකලා ගම්මාන වැඩ සටහන යටතේ අදියර I, II හා III සඳහා ජලනල එලීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතියකට හා වැඩිහිටි සංවිධානයකට රු. 5,376,976 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබු නමුත් ජලනල එලීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන නොතිබු අතර, 2016 මැයි 19 දින වන විටත් ජල සැපයුම ලබාදීම සිදුකර නොතිබුණි. මෙම ජල ව්‍යාපෘතියේ II වන අදියරේ ගෙවීම් කිරිමේදි කොන්ත්‍රාත්කාර සමිතියට රු.400,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**------------------------------**

පිළිසරු ව්‍යාපෘතිය යටතේ සෙවනගල කොම්පෝස්ට් අංගනය ඉදිකිරිම සඳහා රු.2,595,222 ක ඇස්තමේන්තු පිළියෙල කර එම වටිනාකමින් රු. 1,431,060 ක වැඩ කොටස් ඉටු කිරිමට ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ 2011 අප්‍රේල් 18 දින ගිවිසුම් ගතව තිබුණි. එම ව්‍යාපෘතියෙන් සභාවට රු.1,132,858 ක මුදලක් ලැබි තිබු අතර, ඉන් කොන්ත්‍රාත්කාර සමිතියට රු.775,000 ක් ගෙවා තිබුණද 2016 මැයි 19 දිනටත් කොම්පොස්ට් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

-------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

-------------------------------------

සෑම රාජ්‍ය ආයතනයකම සිය දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමේ කාර්යයේදී එකී ආයතනයනට අදාල පාරිසරික හා සමාජ වගකීම් හදුනාගෙන ඒවා ඉටුකිරීම සඳහා උපක්‍රම අනුගමනය කළ යුතු වුවත්, සභාව විසින් ඔවුන්ගේ පාරිසරික හා සමාජ වගකීම හදුනාගැනීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.4 අභ්‍යන්තර විගණනය

----------------------

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරිම

---------------------------------------------------

2009 ජූනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය